# 10 ශ්‍රේණිය

# සිංහල

# මුනි සිරිපා සිඹිමින්නේ

ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි ( 1901 - 1951 )



සැකසුම හා අන්තර්ගතය - කේ. ඒ. ඉන්දික නිරෝෂන් - වයඹ/කිවුලකැලේ මහා විද්‍යාලය , පුත්තලම.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk




# එස්. මහින්ද හිමි. 1

උපතින් ශ්‍රී ලාංකිකයෙකු නොවී, මේ රටෙහි සුන්දරත්වයෙන් අමන්දානන්දයට පත්ව එහි නිදහස වෙනුවෙන් පදා යෙහෙයවූ වෙනත් කවියෙකු නොමැති තරම්ය.

වර්ෂ 1091දී පමණ වර්තමාන සියම් දේශයේ ඉපද, වයස අවුරුදු 12දී සහෝදර පුණ්ණජි හිමියන් සමග බුදු දහම වැඩිදුර ඉගෙනීමේ අරමුණින් ලංකාවට පැමිණ, රත්ගම සිරි චූලසුමන හිමියන්ගේ ගෝලයෙක් ලෙස පැවිදි වූ මේ හිමියන්ගේ මුල් නාමය එස්.කේ. තෂි නම්ග්‍යාල් ය.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk




එස්. මහින්ද හිමි. 2

1918 දී හික්කඩුවේ පොල්ගස් දූවේ, ශෛලබිම්බාරාමයේ දී පැවිද්ද ලැබී ය. රත්මලානේ පුරාණ රාජමහා විහාරයෙන් හා මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනින් පාලි හා සංස්කෘත භාෂාවත්, මරදානේ මහාබෝධි විදුහලින් ඉංග්‍රීසි භාෂාවත් හැදෑරී ය.

1931කේ කොළඹ දී නැවත පැවිද්ද ලබා පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනෙන් අධ්‍යාපනය ලැබ, ප්‍රාචීන මධ්‍යම සමත් ව, කොළඹ ආනන්ද විද්‍යාලයේ ගුරු සේවයට බැඳුණි.


Copyright © e-thaksalawa.moe.gov.lk



## එස්. මහින්ද හිමි රචනා කළ ග්‍රන්ථ කිහිපයක්

1 නිදහසේ දැහැන
2 නිදහසේ මන්ත්‍රය
3 නිදහස
4 අද ලක් මවගේ පුත්තු
5 සිංහල ජාතිය
6 ලංකා මාතා ජාතික කාව්‍ය
7 රාහුල කුමාරයා
8 රත්නමාලී


Copyright © e-thaksalawa.moe.gov.lk



එස්. මහින්ද හිමි රචනා කළ ළමා කාව්‍ය කෘති කිහිපයක්

1 කව් මුතු පොත් පෙළ
2 කව් මිණ පොත් පෙළ
3 ළමා කව් කළඹ
4 ඔවා මුතු දම
5 දරුනැලවිල්ල හෙවත් ජාතික තොටිල්ල
6 නන්දන ගීත


Copyright © e-thaksalawa.moe.gov.lk



එස්. මහින්ද හිමි රචනා කළ ළමා කාව්‍ය කිහිපයක්

1 සමන් පිච්ච මලි ඉහිරුණු....
2 සුරතල් හොඳ හා පැටවා.....
3 මොනව ද මුත්තේ මොක ද කරන්නේ.....
4 බකල කොට ඉබ්බෙක්...


Copyright © e-thaksalawa.moe.gov.lk

1 මුනි සිරිපා සිඹි මි න්නේ
සමනොළ ගිරි පෙදෙ සි න්නේ
මඳ සුළඟ යි මේ එ න්නේ
මගේ පුතා නිදි ය න්නේ

දුරවබෝධ වචන සඳහා අර්ථ

මුනි සිරිපා - බුදුන් වහන්සේගේ පා සළකුණ
මහනොළ ගිරි - ශ්‍රීපාද කන්ද


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

2 නිදහස මහ මුහුද ක් වේ
එහි උල්පත පුත නු ඹ වේ
ඒ බව සිහි කොට මෙලො වේ
යුතුකම ඉටු කළ යු තු වේ

දුරවබෝධ වචන සඳහා අර්ථ

උල්පත - පොළවේ ජලය ගලා යාමට ආරම්භ වන ස්ථානය


e තක්සලාව
The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

3 ජාතික රණ දෙරණ ම තේ
ගැටී වැටී මළ මො හො තේ
සුන්දර සුරඹුන්ගෙ අ තේ
නැළවෙන බව සිතනු පු තේ

දුරවබෝධ වචන සඳහා අර්ථ

රණ දෙරණ - සටන් භූමිය
සුරඹුන් - දිව්‍යාංගනාවන්


Copyright © e-thaksalawa.moe.gov.lk

4 කරදර දහසක් හ මු වී
ඉන්ටැකි නම් සිනා වෙ වී
ඔහු මෙලොවට පහළ දෙ වී
රජෙකැ යි සලකනු මැ න වී

දුරවබෝධ වචන සඳහා අර්ථ

ඉන්ටැකි - සිටියහැකි
දෙව් - දෙව්කෙනෙකි


Copyright © e-thaksalawa.moe.gov.lk

5 තමන් ලැබූ දිවි පෙවෙ තේ
කොටසක් රජ සමය වෙ තේ
පුද නො කළොත් උඹෙන් පු තේ
මෙලොවට කිසි පලක් නැ තේ

දුරවබෝධ වචන සඳහා අර්ථ

දිවි පෙවෙතේ - ජීවත්ව සිටිය දී
සමය - ආගම


Copyright © e-thaksalawa.moe.gov.lk

6 ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලො වේ
සමත් වෙතොත් පුත නුඹ වේ

දුරවබෝධ වචන සඳහා අර්ථ

විමනක් - නිවසක්
මිණි පහනක් - මැණික නමැති ලාම්පුව


Copyright © e-thaksalawa.moe.gov.lk

7 ඉටු කොට කළ යුතු යුතු කම්
ලැබුණොත් ලෝකෙන් ගැර හුම්
ඉවසන්නට පුළුවන් නම්
උඹ යි මගේ පුතා උ තුම්

දුරවබෝධ වචන සඳහා අර්ථ

ගැරහුම් - අපහාස


Copyright © e-thaksalawa.moe.gov.lk

# මුනි සිරිපා සිඹිමින්නේ



8 කාටත් හිමි පොදු දේ නම්
නැති බැරි හිඟ අවහිර කම්
මේ දේ මැඬ ගෙන දස් කම්
පැම තම යි සුරු විරු කම්


Copyright © e-thaksalawa.moe.gov.lk

9
මිතුරු කමින් පෙරට එතො ත්
දූවිල්ලක් එක්ක උණ ත්
මිතුරු වෙයන් පුතේ උඹ ත්
එය යි ලොවේ ගුණය මහ ත්


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

10 සිනිඳු මොළොක් බව ම ලෙහී
පිරිසිදු බව පිනි බි දෙහී
එක් වී මා පුතු ගෙ ළෙහී
අරක් ගනී හැම දි නෙහී

සිනිඳු - මෘදු
මොළොක් - මෘදු
ළෙහී - හදවතෙහි
අරක් ගනී - තැම්පත් වෙයි


Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස

1 මෙම පද්‍ය පන්තියේ ජාතිකාභිමානී හා දේශානුරාගී අදහස් වර්ධනය කරවන අයුරු විමසා බලමු.

මලක මෙලෙක් බව, පිනි බිඳුවෙහි පිරිසිදු බව අරක්ගත් හදවතකින් යුතුව, තමා හා මිතුරු වීමට පැමිනෙන දුහුවිල්ලක් සමඟ වුව ද මිතුරු වීමට තරම් අපූර්ව මිනිසෙක් නිර්මාණය කර ඔහු තුළ මනුෂ්‍යත්වය පමනක් නොව රට, ජාතිය මෙන් ම සමය කෙරෙහි ද යුතුකම් ඉටු කරීමට යොමු වූ ගුණාංග වර්ධනය කිරිම කතුවරයාගේ අරමුණ බව, මුණි සිරිපා සිඹිමින්නේ යන පද්‍ය පන්තියෙන් හඳුනා ගත හැකි ය.

අනෙක් පිට බලන්න.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 1

තමන්ගේ ජීවිතයෙන් කොටසක් ලෙස රට හා සමය හඳුන්වාදෙන කවියා එම මහඟු සම්පත් ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකරන්නේ නම් පුතුගෙන් කිසිදු ප්‍රයෝජනයක් නොමැති බව පෙන්වා දෙයි.

“ තමන් ලැබූ දිවි පෙවෙ තේ
කොටසක් රජ සමය වෙ තේ
පුද නො කළොත් උඹෙන් පු තේ
මෙලොවට කිසි පලක් නැ තේ ”

ලෙසට පවසා තිබීමෙන් එය තහවුරු වේ. ජාතිය රන් විමානයක් බවත්, ආගම නම් මැණික් පහනක් බවත් ඒ මහාර්ඝ වස්තු ආරක්ෂා කර ගැනීම පුතුගෙන්

අනෙක් පිට බලන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 1

ඉටුවීමේ අවශ්‍යතාවය ද පෙන්වා දී ඇත.

“ ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලො වේ
සමත් වෙතොත් පුත නුඹ වේ ”

ලෙසින් වක්‍රාකාරව ප්‍රකාශ කර සිටින්නේ එය ඉටු කළ හැක්කේ පුතුට ම බව දක්වමින් දරුවාගේ සිතෙහි ධෛර්යයක් ද ජනිත කරවමිනි.

විශේෂයෙන් ම රට විදේශිකයන්ගේ යටත් විජිතයක් ව පවතින සමයක දී රට කෙරෙහි උපන් ඇල්මකින් යුතු ව මහා සමුද්‍රයක් හා සම නිදහස දිනා ගැනීම වෙනුවෙන් කටයුතු කර තමන්ගේ යුතුකම ඉටු කරන ලෙස

අනෙක් පිට බලන්න.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 1

ප්‍රකාශ කර තිබෙන්නේ, ලෝකයට ම උතුම් ධර්මයක් ප්‍රකාශ කළ බුදු හිමියන්ගේ පාද ස්පර්ෂයෙන් පූජනීයත්වය පත්, සමනළ පර්වතය සිප එන සුළඟ ද සහිත මේ මාතෘ භූමිය බේරා ගැනීමේ උදාර කාර්යේ දී, යුධ භූමියේ දී මරණයට පත් වුව ද එම පිණ දිව්‍ය ලෝකයේ ඉපදීමට තරම් ප්‍රමාණවත් බව දක්වමිනි.

" ජාතික රණ දෙරණ ම තේ
ගැටී වැටී මළ මො හො තේ
සුන්දර සුරඹුන්ගෙ අ තේ
නැළවෙන බව සිතනු පු තේ "

අනෙක් පිට බලන්න.



Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 1

මේ අනුව බැලීමේ දී රට, දැය, සමය ආරක්ෂා කර ගැනීමට දිවි හිමියෙන් කටයුතු කිරීමට මේ රටහි උපදින දරුවන් ගෙන් අපේක්ෂිතය. සිතෙහි ඇති වූ ආගමික ක්ෂික්ෂණයෙන්, විනයෙන් හා ධෛර්යයෙන් යුතු පිරිසක් බවට කුඩා දරුවන් පත් කිරීමට කතුවරයා ගෙන ඇති උත්සාහය සාර්ථක වී ඇති බව පෙන්වා දිය හැකි ය.

අනෙක් පිට බලන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස

2 මෙම පද්‍ය නිර්මාණය සාර්ථක කර ගැනීමට කවියා යොදාගෙන ඇති විවිධ කාව්‍යමය උපක්‍රම සාකච්ඡා කිරීම.

කිසියම් සාහිත්‍ය කරුවෙකුගේ සිතට පත් සිදුවීමක්, අත්දැකීමක් සහෘද පිරිසක් වෙත පැමිණවීමේ දී ඒ සඳහා භාවිත කළ හැකි හොඳම සාහිත්‍යාංගයක් ලෙස කවිය අවිවාදයෙන් පෙන්වා දිය හැකි ය. එහි දී කවියා යොදාගන්නා කාව්‍ය උපක්‍රම අදාල කාර්යයේ සාර්ථකත්වයට මහත් පිටිවහලක් වෙයි. එස්.මහින්ද හිමියන්ගේ උත්ත පද්‍ය පන්තියේ කාව්‍ය උපක්‍රම සේ යෙදෙන ශබ්ද හා අර්ථ රස මෙසේ විමසා බලමු.

අනෙක් පිට බලන්න.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 2

කවියා යොදාගෙන ඇති විරිත, විශේෂයෙන් ම දරුවෙක් නිදි යහනේ දී නැලවීමට මවක් විසින් සුගායනීය නැළවිලි ගී ආකාරයට පද්‍ය රචනා කර තිබෙයි. පද්‍ය පාදයකට මාත්‍රා 12ක් යෙදෙන, මාත්‍රා 6න් 6ට යතිය(විරාමය) පිහිටන, පද්‍ය පාදය අවසානයේ දිගු(ගුරු) අකුරක් යෙදෙන යොන්මත් වැල නම් සිවුපද විරිත යොදාගෙන ඇත.

" මුනි සිරිපා සිඹි මි න්නේ
සමනොළ ගිරි පෙදෙ සි න්නේ
මඳ සුළඟ යි මේ එ න්නේ
මගේ පුතා නිදි ය න්නේ " මෙය නිදි යහනක සිටින දරුවාට නින්දට උචිත පසුබිමක් සැපයිමට හේතු ය.

අනෙක් පිට බලන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 2

තව ද සෑම කවියක ම පාදාන්ත එළි සමය භාවිත කර තිබීම ද, ශබ්ද රස උත්පත්තියට හේතු ය.

ගැටී වැටී, රණ දෙරණ, විමනක්, පහනක්

ලෙසට අනුප්‍රාසාත්මක පද භාවිතය ද ශබ්ද රසම ජනනය කරයි.

අර්ථ රස ජනනය කිරිමට භාවිත යෙදුම් අතුරෙහි දී රූපකාර්ථවත් භාෂාව බහුලව භාවිත කර ඇත.

“ ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ ”

අනෙක් පිට බලන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 2

" නිදහස මහ මුහුද ක් වේ "

වැනි අවස්ථානුචිත යෙදුම් ඇසුරින් මේ වග තහවුරු කරගත හැකි ය. කුඩා දරුවන් ආසාවෙන් ප්‍රමුදිත වන පද භාවිත කිරීම ද

" සිරිපාදය, සුරන්ගනාවන්, මැණික්, මල්, පිනි " යනා දී අර්ථ උපදින පද යොදා තිබීම ද කුඩා දරුවන්ට ආවේනික බවක් ඇති කරයි.

අනෙක් පිට බලන්න.



Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 2

තව ද සරල භාෂාව හා විදග්ධ භාෂාව සම්මිශ්‍රිත වචන ආශ්‍රෙයන් ද අර්ථාන්විත භාෂාව ගොඩ නගා ඇති අයුරු

“ සරල භාෂාව - පුතා, සුළඟ,ආගම, පහන, පිනි
විදග්ධ භාෂාව - මුනි, ගිරි,දෙරණ, සුරඹුන්, විමන ”

වැනි පද යොදාගෙන තිබීමෙන් අවබෝධ කරගත හැකි ය. ව්‍යංගර්ථවත් ව භාෂාව යොදා තිබීම ද අභ්‍යන්තර අර්ථ සම්පාදනය කරයි.

“ නිදහස මහ මුහුද ක් වේ
එහි උල්පත පුත නුඹ වේ ”

“ සුන්දර සුරඹුන්ගෙ අතේ
නැළවෙන බව සිතනු පුතේ ”

අනෙක් පිට බලන්න.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 2

වැනි යෙදුම් ආශ්‍රෙයන් අවබෝධ කර ගත හැකි ය. එසේම ව්‍යවහාර භාෂාවේ යෙදෙන කට බස් වචන ද මෙහි භාවිත ය.

" නිදියන්නේ, උල්පත, යුතුකම්, වැටී, ඉන්ටැකි, රජෙකු, නැති බැරි " වැනි පද කෙරෙන් ඒ වග අවබෝධ වේ.

මේ අනුව බැලීමේ දී අරමුණට උචිත විරිතක් හා අනුප්‍රාසය, එළිසමය, වැනි ශබ්ද රස ඇති කරන කාව්‍යාලංකාර ද, රූපක, ව්‍යංගාර්ථ වැනි අර්ථ රසය ඇති කරන භාෂාව ද, සරල හා විදග්ධ මෙන්ම භාවිත භාෂාව හා සිවුපද ආකෘතිය යොදාගෙන තිබීම යනා දී කරුණු ආශ්‍රෙයන් කවියාගේ කාව්‍ය උපක්‍රම භාවිතය පිළිබඳව පැහැදිලි කර දිය හැකි ය.

අනෙක් පිට බලන්න.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස

3 චරිත සංවර්ධනයට නිර්මාණාත්මකව අදහස් ඉදිරිපත් කරන ප්‍රතිභාපූර්ණ කවියෙක් මෙම පාඩමෙන් අපට හමුවන අයුරු විමසා බලමු.

මුනි සිරිපා සිඹිමින්නේ පාඩමෙන් අපට හමුවන්නේ කුඩා දරුවන්ට තමන්ගේ අනාගත ජීවිතයේ දී රට, දැය, සමය කෙරෙහි වූ වගකීමෙන් හා කැපවීමෙන් මෙන් ම, ආදර්ශවත් චරිතයක් ඇති ගුණදහමින් පිරිපුන් අයෙක් ලෙස ගොඩනැගීමට උපදෙස් ලබාදෙන කාව්‍යාවලියකි.

ප්‍රතිභාව යනු අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව ලෙස ගැනීමේ දී මෙම කවියා මෙරට සංස්කෘතික පරිසරයෙන් උත්දීප්ත වූ මනසින් යුතුව දේශීය ජන ගී තාලයානුගත වෙමින් ප්‍රතිභාපූර්ණ පදාවලියක් රචනා කර ඇති බව හඳුනා ගත හැකි ය. ඒ සිය අරමුණානුගතව සිය අත්දැකීම් මෙහෙයවා තිබෙන බැවිනි.

අනෙක් පිට බලන්න.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 3

" මුනි සිරිපා සිඹි මි න්නේ
සමනොළ ගිරි පෙදෙ සි න්නේ
මඳ සුළඟ යි මේ එ න්නේ
මගේ පුතා නිදි ය න්නේ "

මෙයින් දක්වා තිබෙනුයේ බුදුන්ගේ පාද ස්පර්ෂයෙන් පූජනීයත්වය පත් ( බුද්ධ දේශනාවෙන් හික්මීමක් ලද ජන පිරිස් වාසය කරන ද්වීපය ) භූමිය සිප එන සිසිල් සෞම්‍ය මන්ද මාරුතයේ පහස විඳිමින්, සතුටින්, ආරක්ෂාකාරීව පුතාට සුව නින්දක් ලැබෙන බවයි.

මේ නින්දට සුදුසු වාතාවරණය මීට පෙර දැක දැක්වූවෙක් නැති. එනම් මේ අපූර්ව වස්තු සංකලනයකි. මෙහි එන දෙවන කවිය

අනෙක් පිට බලන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk

" නිදහස මහ මුහුද ක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහි කොට මෙලො වේ
යුතුකම ඉටු කළ යු තු වේ "

ලෙසින් රූපකාර්ථවත්ව නිදහසේ වටිනාකම පෙන්වා දෙමින්, එහි ආරම්භය සිදුකළ යුත්තා ( උල්පත) නුඹ යැයි දක්වන්නේ ද නව්‍ය සංකල්ප හා සම්බන්ධ කිරිමෙනි. මෙම පද්‍ය පුරාම මෙම තත්වය දැකගත හැකි ය.

චරිත සංවර්ධනය ද මෙහි අභ්‍යන්තරයෙන් දිවෙන අරමුණක් සේ හැඟෙන පරිද්දෙන් ම උත්තම ගුණ යහපත්කම් සපිරි චරිත ගොඩනැඟීමට කටයුතු කර ඇති බව ද දැකගත හැකි ය.

අනෙක් පිට බලන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk

“ ඒ බව සිහි කොට මෙලො වේ
යුතුකම ඉටු කළ යු තු වේ ”

මෙලොව දී කළ යුතු යුතුකම් ඉටුකිරීම, කරදර දහසක් හමුවේ ද නොසැලී සිටීමේ හැකියාව ඇත්නම් ඒ දේව ලක්ෂණයක් බව ද,

“ කරදර දහසක් හ මු වී
ඉන්ටැකි නම් සිනා වෙ වී
ඔහු මෙලොවට පහළ දෙ වී
රජෙකැ යි සලකනු මැ න වී ”

රට, සමය වෙනුවෙන් කළ යුතු දේ ඉටු නො කළේ නම් පුතුගෙන් ලෝකයට කිසි පලක් නොමැති බව ද

අනෙක් පිට බලන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk

" තමන් ලැබූ දිවි පෙවෙ    තේ
කොටසක් රජ සමය වෙ    තේ
පුද නො කළොත් උඹෙන් පු    තේ
මෙලොවට කිසි පලක් නැ    තේ "

මේ අයුරින් දක්වා තිබෙයි. එයින් ද නො නැවතී පෙන්වා දෙනුයේ තමන්ට කිරීමට ඇති යුතුකම් ඉටුකර ලෝකයෙන් කෙනෙක් ගැරහුම් ලැබූවත් ඒ ඉවසීමට හැකිනම් ලෝකයෙන් උත්තම පුත්‍රයා නුඹ ලෙස පෙන්වා දී ඇත.

" ඉටු කොට කළ යුතු යුතු    කම්
ලැබුණොත් ලෝකෙන් ගැර    හුම්
ඉවසන්නට පුළුවන්    නම්
උඹ යි මගේ පුතා උ    තුම් "

අනෙක් පිට බලන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk

මේ චරිත සංවර්ධනයට ලබා දෙන උපදෙස් කිහිපයක් පමණි.

ඒ අනුව බැලීමේ දී උත්තම චරිත සංවර්ධනයෙහිලා ප්‍රතිභාපූර්ණ කාව්‍ය සංකල්පනා මෙහෙයවා ඇති බව පෙන්වා දිය හැකි ය.

**සමාප්තයි**


Copyright © e-thaksalawa.moe.gov.lk